# වංචාවෙන් තොර නිවැරදි ගමනකට ගම්පහ ප්‍රා.සභාව යොමු කරනවා



## ගම්පහ ප්‍රා. සභා අපේක්ෂක-**අනුෂ්ක හෙට්ටිආරච්චි** (ජාතික ජන බලවේගය)

**තක්ෂිලා උදයංගනී**

ගම්පහ ප්‍රාදේශීය සභාව වංචාවෙන් තොර, නිවැරදි ගමන් දිශාවකට යොමු කිරීමට හැකි වන ආකාරයේ ප්‍රාදේශීය සභාවක් ලෙස ගොඩනැඟීමට තම කණ්ඩායම බලාපොරොත්තු වන බව, ගම්පහ ප්‍රාදේශීය සභාවේ බුළුගහගොඩ කොට්ඨාසයේ ජාතික ජන බලවේග අපේක්ෂක අනුෂ්ක හෙට්ටිආරච්චි මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද කීවේය.

"අපි මෙවර ජාතික ජන බලවේගය පක්ෂයෙන් ගම්පහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් වෙන්නෙ කණ්ඩායමක් විදිහට. රජයේ ප්‍රමුඛ අරමුණ වන ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමත්, ඔවුන්ගේ සුබසාධන කටයුතු ක්‍රමවත්ව හා විධිමත්ව ඉටු කිරීමත් කියන කාරණා මුල් කරගෙන අපි කණ්ඩායමක් විදියට ඒකරාශි වුණා. මෙතෙක් පැවති ක්‍රමවල පවතින දූෂණ, වංචා හා අක්‍රමිකතා නැති කරලා කාන්තාවන් බලගැන්වීම, ඔවුන් ආර්ථික වශයෙන් දිරිගැන්වීම සහ ඔවුන්ට ස්වාධීනව නැඟීසිටීමට අවස්ථාවක් සැලසීම අපේ අපේක්ෂාවයි. ඒ වගේම මෙතෙක් ප්‍රාදේශීය වශයෙන් පුරන් වෙලා තියෙන කෘෂිකාර්මික ඉඩම් නැවත ජාතික මට්ටමට ගෙන ඒමට සහ ඒ වගා භූමි ජාතික අවශ්‍යතාවට අනුව ගොඩනැඟීමට අපි බලාපොරොත්තු වෙනවා. ප්‍රාදේශීය සභාව කියන්නේ උපතේ සිට මරණය දක්වා මිනිසාගේ ජන ජීවිතයට සම්බන්ධ වෙන ආයතනයක්. ඒ ආයතනය හරහා සිදු වන සියලුම සුබසාධන කටයුතු මහජනතාවට නිසි අයුරින් ඉටු කිරීමටත්, වංචාවෙන් තොර නිවැරදි ගමන් දිශාවකට යොමු කිරීමටත් හැකි වන ආකාරයේ ප්‍රාදේශීය සභාවක් ගොඩනැඟීමටත් තමයි අපි කණ්ඩායමක් විදියට මෙවර පළාත් පාලන ආයතනවලට ජාතික ජන බලවේගය පක්ෂයෙන් ඉදිරිපත් වෙන්නෙ."



# ගමේ සටනින් ඇසුණු කතා

# ගසාකෑම්වලින් තොර නගර සභාවක් ගොඩනඟනවා



## මාතලේ මහ නගර සභා අපේක්ෂිකා **රූපා පෙරේරා අබේසේකර** (ජාතික ජන බලවේගය)

**නිපුනි ශාරදා**

මාලිමා රජයේ ප්‍රතිපත්තිය වන 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' යන ප්‍රතිපත්තිය මල්ඵල ගැන්වීම සඳහා නගරවැසියන්ගේ අදහස් එක් කරගෙන සකස් කරගත් සැලසුමක් ඔවුන් සතුව ඇති බව මාතලේ මහ නගර සභාවේ මාලිගාතැන්න කොට්ඨාසයේ ජාතික ජන බලවේග අපේක්ෂිකා රූපා පෙරේරා අබේසේකර මහත්මිය පැවසුවාය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහත්මිය මෙසේද කීවාය.

"මාලිමා රජයේ ප්‍රතිපත්තිය වන "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" යන අභිප්‍රාය මල්ඵල ගැන්වීම සඳහා නගරවැසියන්ගේ අදහස් එක් කරගෙන අපි සැලසුමක් සකස් කරලා තියෙනවා. විශේෂයෙන් මාතලේ කසළ කළමනාකරණයත්, ළමා හා කාන්තා සුබසාධනයත්, ව්‍යාපාරිකයන් මුහුණ දෙන ගැටලු විසඳා ගැනීම සඳහාත් කැප වී කටයුතු කිරීමට අප සූදානම්. අපි සියලු දෙනා පෞද්ගලික ලාභ අපේක්ෂාවන් හා පටු අරමුණුවලින් තොරව කණ්ඩායමක් ලෙස එකතු වෙලා, මේ සැලසුම ප්‍රමුඛ ලේඛනයක් සකසාගෙන නිසි කළමනාකරණයකින් හා මූල්‍ය පරිචයකින් ක්‍රමවත්ව කටයුතු කිරීම අපේ බලාපොරොත්තුවයි. මාතලේ පුරවැසියන් ගෙවන බදු මුදලට සරිලන සේවාවක් කාර්යක්ෂමව හා සුහදව සපයන, ගසාකෑම්වලින් තොර පරිපාලනයක් ඇති නගර සභාවක් ගොඩනැඟීම අපේ දැක්මයි. ඒවගේම කාන්තාවන් සඳහා ව්‍යවසායිකාවන් ලෙස කටයුතු කිරීමට සුදුසු පරිසරයක් සකස් කරන්නත්, කාන්තාවන්ගේ ගෘහ ආර්ථිකය සවිමත් කිරීමට විශේෂ වැඩපිළිවෙළක් යොදන්නත් අපි කටයුතු කරනවා.

මාතලේ නාගරික ජනතාවගේ පොදු සුබසාධන ක්‍රියාවලිය සඳහා විධිමත් වැඩපිළිවෙළක් අපි යෝජනා කරනවා."

# බුලත්සිංහල ගොඩනඟන්න පාරිසරික සංචාරක කර්මාන්තය හොඳටම ඇති

## බුලත්සිංහල ප්‍රා. සභා අපේක්ෂක **තුසිත කුලරත්න** (ස්වාධීන කණ්ඩායම්)

**කළුතර මධ්‍යම සමූහ සුනිල් ස්ටැන්ලි**



තේ, රබර්, පොල් මෙන්ම සුළු අපනයන භෝග සමඟ බැඳුණු ආර්ථිකයක් තිබෙන බුලත්සිංහල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය තවදුරටත් ඉහළට නංවාලීමට නම් විකල්ප ආදායම් උත්පාදන මාර්ගයකට යා යුතු බවත්, ඒ සඳහා ප්‍රාග් ඓතිහාසික පාහියංගල ඇතුළු තවත් ස්වාභාවික සම්පත් සමඟ බැඳුණු පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීමෙන් බුලත්සිංහල පුරවරය ගොඩනැංවිය හැකි බවත් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට කොස් ගෙඩිය ලකුණින් තරග වදින ස්වාධීන අපේක්ෂක තුසිත කුලරත්න මහතා පැවසීය.

හෙතෙම වැඩිදුරටත් මෙසේ ද කීය.

"වර්තමානයේ පාරිසරික සංචාරක කර්මාන්තයට දෙස් - විදෙස් සංචාරකයන්ගේ හොඳ ඉල්ලුමක් පවතිනවා. මේ රටට තව තවත් ඩොලර් ගෙනෙමින් ආදායම් උත්පාදන මාර්ග ඇතිකිරීමට බුලත්සිංහල තිබෙන දිය ඇලි, ගංගා, වනාන්තර ආදී ස්වාභාවික සම්පත් හොඳටම ප්‍රමාණවත්. ඒ සඳහා තිරසර සංවර්ධන ක්‍රමෝපායික වැඩපිළිවෙළක් මා සතුව තිබෙනවා. මම 1997 අවුරුද්දේ ප්‍රාදේශීය සභාවට මුලින්ම පත්වෙලා ඇවිත් දෙවරක් මන්ත්‍රීවරයකු වශයෙන් සහ දෙවරක් සභාපති වශයෙන් බුලත්සිංහලට කළ, කී දැවැන්ත සංවර්ධන වැඩපිළිවෙළ ගැන ජනතාව දන්නවා. පසුගිය කාලය තුළ ජනතාව දිගින් දිගටම මගෙන් කළ ඉල්ලීම නිසාම නැවතත් නැවතුණු තැනින් යළි සංවර්ධනය ආරම්භ කරන්න මම වගකීම් භාරගන්න සූදානම්. ඒ සඳහා කිසිදු වංචා දූෂණයකින් තොර පිරිසුදු කණ්ඩායමක් මම ඉදිරිපත් කරලා තිබෙනවා."

# දූෂිත ක්‍රමයට තිත තබා ග්‍රාමීය ආර්ථිකය නංවනවා

## උඩුනුවර ප්‍රා. සභා අපේක්ෂක **සන්ද්‍රයා වැලිඅංග විජේතුංග** (ජාතික ජන බලවේගය)

**උඩුනුවර සමූහ පෙරමුණේ කුලරත්න**



උපතේ සිට මරණය දක්වාම ග්‍රාමීය ජනතාවට සියලු සේවාවන් ලබාදිය හැකි එකම ආයතනය ප්‍රාදේශීය සභාව බවත්, එහි පාලන බලය ලබාගෙන එම ආයතනවල පැවති දූෂිත ක්‍රමය වෙනස් කර ග්‍රාමීය ජනතාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට කැපවන බවත් ජාතික ජන බලවේගයේ උඩුනුවර ප්‍රාදේශීය සභාවට තරග කරන සන්ද්‍රයා වැලිඅංග විජේතුංග මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"මම ගමේ ජනතාවගේ අවශ්‍යතාවන් හඳුනාගෙන තියෙනවා. ජනාධිපතිවරණයේදීත් මහමැතිවරණයේදීත් ජනතාව අප කෙරෙහි තැබූ බලාපොරොත්තුව මෙවර මැතිවරණයේදීත් තියනවා. ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරලා දූෂණයෙන් තොර පාලනයක් ඇතිකිරීමයි අපේ බලාපොරොත්තුව. ඒ සඳහා මම උපරිම අයුරින් කැපවෙනවා."

# සලකුණක් ඕනෑ ඡන්දයට එන්නයි: ජනතා සේවයට ඒවා අදාළ නෑ

## මාතර මහ නගර සභා අපේක්ෂක **මලිදු ගජදීර** (ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය)

**නුවන් කොඩිකාර**



මැතිවරණයට ඉදිරිපත් වීමට සලකුණක් අවශ්‍ය වුවත්, ජනතාවට සේවය කිරීමේදී ඒ කිසිවක් බලනොපාන බව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ මාතර මහ නගර සභාවේ නගරාධිපති ධුර අපේක්ෂක මලිදු ගජදීර මහතා පැවැසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

"මාතර මහ නගර සභාවේ මන්ත්‍රීවරයකු ලෙස සිටි කාලය තුළ සමානාත්මතාව වෙනුවෙන්, මිනිසුන් වෙනුවෙන් මම පෙනී සිටියා. එම කාලය තුළ පූර්ණකාලීනව මිනිසුන් වෙනුවෙන් උපරිම කැපකිරීම් කළා. ජනතාවාදී ආදර්ශවත් නායකයන් ගොඩනඟපු පක්ෂයකින් මෙවර මැතිවරණයට ඉදිරිපත් වීමට ලැබීම සතුටක්. මෙරට ජනතාවගේ සිත්වලින් ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය මකා දැමිය නොහැකියි. මෙරට සෑම මැතිවරණයකම තීරණාත්මක පක්ෂය බවට කොමියුනිස්ට් පක්ෂය පත් වෙනවා. මෙවර ද එය නියත වශයෙන්ම සිදු වෙනවා. අපට මැතිවරණයට ඉදිරිපත් වෙන්න සලකුණු අවශ්‍ය වුණත් ජනතා සේවයට ඒ ඒ පුද්ගලයන් වෙන් කර අපේ සේවය ලබා දෙන්න කිසි දිනක පක්ෂය හෝ ලකුණු මත පදනම්ව ක්‍රියා කර නැහැ. නගරයේම ඉපදුණ අය විදියට නගරයේ හෙට දවස වෙනුවෙන් අපට ඉටු කරන්න විශාල කාර්යභාරයක් තිබෙනවා. භෞතික සංවර්ධනය වගේම නාගරීකරණයෙන්, තරගකාරීත්වයෙන් හෙම්බත්වෙලා ඉන්න මිනිසුන්ගේ මානසික සංවර්ධනය වෙනුවෙන් සතුට වෙනුවෙන් අපි කටයුතු කළ යුතුයි. අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා මාතර මහ නගර සභාවේ බලය ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයට ලබා දෙන්න කටයුතු කරන්න කියලා. අපේ ආදර්ශ පාඨය 'මනුෂ්‍යත්වයේ පුරවරය' යන්නයි. එය සාක්ෂාත් කරන්න අප කටයුතු කරනවා."

# වාමාංශික නැඹුරුවකින් මහජනයාට තවදුරටත් සේවය කරනවා

## මහරගම නගර සභා අපේක්ෂක **නිරෝෂ් දෙල්පෙචිත්‍ර** (ස්වාධීන කණ්ඩායම අංක 1)

**උදාරා පාරමී**



වාමාංශික දේශපාලන පවුලකින් පැවත එන තම පියාගේ දේශපාලන සහ මහජන මෙහෙවර තවදුරටත් ඉදිරියට කරගෙන යමින් ප්‍රදේශයේ ජනතාවට සේවය සැපයීම තම ඒකායන අරමුණ බව මහරගම නගර සභාවට කළල්ගොඩ මැතිවරණ කොට්ඨාසයෙන් ස්වාධීන කණ්ඩායම අංක එක යටතේ හැන්ද ලකුණින් තරග කරන නිරෝෂ් දෙල්පෙචිත්‍ර මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

"හිටපු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන මහත්වරුන්ගේ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරිවරයකු හැටියට කටයුතු කිරීමට මට අවස්ථාව ලැබුණා. එයින් ලැබුණු පන්නරය තුළින් කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්, පෙර පාසල්, මාතෘ සායන, ළමා සායන සහ ස්වේච්ඡා සංවිධානවලට විශාල සේවයක් කිරීමට ද මට හැකිවුණා. නව ලිබරල් ආර්ථික පරිසරයක් යටතේ ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා ද මම යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. හිටපු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ විමධ්‍යගත අරමුදල් යොදවා මගේ සංකල්පයකට අනුව තලවතුගොඩ නගරයේ බහුවිධ වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර, මහරගම නගර සභාව වෙත ඉදිකිරීම් සඳහා භාර දීමට මට හැකියාව ලැබුණා."

# ප්‍රදේශයේ ජල ප්‍රශ්නයට විසඳුම් දීම ප්‍රධාන කාර්යය කර ගන්නවා

## මොරවැව ප්‍රා.සභා අපේක්ෂක **යූ.එම්.කේ.ජී. රත්නායක** (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)

**ත්‍රිකුණාමලය විශේෂ - ඒ.ටී.එම්. ගුණානන්ද**



ඉදිරියේදී මොරවැව ජනතාවගේ ජල ප්‍රශ්නයට අනිවාර්යයෙන්ම විසඳුමක් ලබා දෙන බවත්, එය තම ප්‍රධාන රාජකාරිය කර ගන්නා බවත් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මොරවැව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුර අපේක්ෂක යූ.එම්.කේ.ජී. රත්නායක මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"මොරවැව ජනතාවගේ ප්‍රධාන ගැටලු අතර උග්‍ර ප්‍රශ්නයක් තමයි පානීය ජල ගැටලුව. මම ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් විදිහට තුන්වරක් ප්‍රාදේශීය සභාවේ හිටියා. ඒ නිසා මේ ප්‍රශ්නය මම හඳුනාගෙන තියෙනවා. මේ හේතුවෙන් ප්‍රදේශයේ වකුගඩු රෝගීන් වැඩි වෙලා. මෙයට විසඳුමක් ලෙස මගේ කාලයේ ප්‍රතිආශ්‍රිත ජල පෙරන යන්ත්‍ර තුනක් සවි කළා. එය ජනතාවගේ අවශ්‍යතාවන්ට ප්‍රමාණවත් මදි. තවත් කිහිපයක් සවි කළ යුතුයි. ඉදිරියේදී මම මේ ප්‍රශ්නයට අනිවාර්යයෙන්ම විසඳුම් ලබා දෙනවා. මගේ නායකත්වය තුළින් ඉදිරි ජනතා ගැටලු විසඳීමට බලාපොරොත්තු වෙනවා."

# ගමේ පොදු ගැටලුවලට ඉක්මන් විසඳුම් දෙනවා

## කොළඹ නගර සභා අපේක්ෂක **ප්‍රදීප් කුමාර** (එක්සත් ජනරජ පෙරමුණ)

**ඉෂාරා දේවින්දනී**



තම සේවය උතුරු බොරැල්ල කොට්ඨාසයේ ජනතාවට මෙන්ම මුළු නගරයේම ජනතාව වෙනුවෙන් ලබාදීම අරමුණ බවත්, ව්‍යවසායකයකු වන තමා දේශපාලනයට පිවිසියේ ජනතා සේවය වෙනුවෙන් බවත්, උතුරු බොරැල්ල කොට්ඨාස එක්සත් ජනරජ පෙරමුණු අපේක්ෂක ප්‍රදීප් කුමාර මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේ ද කීය.

"ගමේ කිසිදු කටයුත්තකදී පළාත හෝ ප්‍රදේශය නියෝජනය කළ මන්ත්‍රීවරයා අපට මුණගැසීමට හෝ කිසියම් කාර්යයක් සිදු කර ගැනීමට යෑමේදී තිබූ අපහසුතාව ගැන පසුගිය කාලය තුළ අපට අත්දැකීම් තියෙනවා. මේ මගේ ගම් ප්‍රදේශය, මා ජීවත්වන ප්‍රදේශය නිසා දවසේ ඕනෑම වේලාවක් මාගේ ජනතාව සමඟ රැඳී සිටින බවට මම පොරොන්දු වෙනවා. ගමේ පවතින පොදු ගැටලු ඉක්මනින් විසඳා දෙන බවටත් මම පොරොන්දු වෙනවා.

බේස්ලයින් ඇළ මාර්ගය වැටී ඇත්තේ අපේ ගම මැදින්. එම ඇළ දැන් කුණුකසළවලින් පිරිලා. මේ ඇළ මාර්ගයට කොළඹම අපජලය එකතු වෙනවා. බන්ධනාගාරයේ වැසිකිළි ජලය පවා එකතු වෙන්නේ මෙම ඇළ මාර්ගයටයි. මේවා නිවැරදි කරන්න මම කටයුතු කරනවා."

# පක්ෂ-පාට බලන්න එපා: ගමට හිතැති කෙනාට ඡන්දය දෙන්න

## මොනරාගල ප්‍රා. සභා අපේක්ෂක-**පියසෝම එලගල්ල** (පොදුජන එක්සත් පෙරමුණ)

**ඌව වෙල්ලස්ස විශේෂ ඩී.එස්. ගුණතිලක**



"පළාත් පාලන මැතිවරණයේදී පක්ෂ පාට බලන්න එපා. ගමට හිතැති කොට්ඨාසයේ පදිංචිකරුවකුට ඡන්දය දෙන්න" යැයි පොදුජන එක්සත් පෙරමුණේ මොනරාගල, හුලංදාව අපේක්ෂක පියසෝම එලගල්ල මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද පැවසීය.

"පළාත් පාලන මැතිවරණයේදී ඔබ ඡන්දය දිය යුත්තේ ගමේ මඟුලට මරණයට පැමිණෙන ජනතාවත් සමඟ සිටින ඔවුන්ගේ දුකේදී සහ සැපේදී නිතර සිටින කොට්ඨාසයේ පදිංචි අපේක්ෂකයාටයි. මාලිමාව කොට්ඨාසයෙන් අපේක්ෂකයකු තෝරා ගැනීමට නොහැකි තත්ත්වයට බංකොලොත් වෙලා. වෙනත් කොට්ඨාසයක පදිංචිකරුවකු ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රදේශයේ ජනතාව ඔහුව හඳුනන්නේවත් නැහැ.

ජනාධිපතිවරණයේදී සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී රටේ බහුතරය මාලිමාවට ඡන්දය දුන්නා. පක්ෂ භේද අමතක කර දමා සියලුදෙනා එක්ව කොට්ඨාසයට සේවයක් කළ හැකි කොට්ඨාසයේ පදිංචිකරුවකුට ඡන්දය දෙන්න. අපි සෑම කොට්ඨාසයකටම උගත් පිරිසක් ඉදිරිපත් කර තිබෙනවා. එබැවින් මොනරාගල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට විශාල සේවයක් ඉටු කිරීම සඳහා පොදුජන එක්සත් පෙරමුණට සභාවේ පාලනය ලබා දෙන්න."

# බලය දුන්නොත් වැඩ පෙන්වන්නම්

## මහඔය ප්‍රා.සභා අපේක්ෂක **දර්ශන ජයතිලක** (එක්සත් ජාතික පක්ෂය)

**දිගාමඩුල්ල විශේෂ වසන්ත චන්ද්‍රපාල**



"එදා වේදිකාවල කිවුව කිසිම දෙයක් ජනතාවට ඉටු වෙලා නැහැ. අඩුම වශයෙන් බින්තැන්නේ ජනතාවට ගංවතුරින් වුණු හානියටවත් ගෙවන්න මේ අයට හැකි වෙලා නෑ" යැයි මහඔය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් අරන්තලාව කොට්ඨාසයෙන් තරග වදින එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රණවිරු දර්ශන ජයතිලක මහතා පැවසීය.

ඔහු වැඩිදුරටත් මෙසේද කීය.

"මමත් යුද්ධයට මුහුණ දුන්න රණවිරුවෙක්. දැන් මට අවශ්‍ය මගේ ගමේ යටිතල පහසුකම් ලබා දීලා ගමේ අය වෙනුවෙන් යමක් කරන්න. ඒකට මට ශක්තියක් තියෙනවා. ඒක නිසා තමයි මම මේ ගමන එක්සත් ජාතික පක්ෂයෙන් අරන්තලාව කොට්ඨාසයෙන් තරග වදින්න තීරණය කරේ. ඒ නිසා මහඔය ප්‍රාදේශීය සභාව තුළින් විධිමත් වැඩපිළිවෙළක් කරන්න මෙවර බලය අපට දෙන්න. අපි වැඩ කරලා පෙන්වන්නම්."

# ගම ගැන අවබෝධයක් ඇති අය තෝරා ගැනීම ජනතා වගකීමක්

## මිනුවන්ගොඩ ප්‍රා. සභා අපේක්ෂක **සරණපාල විජේසිංහ** (සමගි ජන බලවේගය)

**වේයන්ගොඩ සමූහ සරත් පුෂ්ප කුමාර**



ජනතාව අපහසුතාවට පත් නොකොට දැනට පවත්නා වූ පරිපාලනය ක්‍රමවත්ව සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින්, ජනතාවගේ අඩුපාඩු හා ගැටලු හඳුනාගෙන ලැබෙන ප්‍රතිපාදන මත උපරිම සේවාවක් සැලසීම තම අරමුණ බව සමගි ජන බලවේගයේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා අපේක්ෂක සරණපාල විජේසිංහ මහතා පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීය.

"ජාති, කුල, ආගම්, පක්ෂ භේදයකින් තොරව ප්‍රදේශය තුළ ස්ථාවරත්වයක් ඇති කිරීම සඳහා රාජ්‍ය හා පළාත් සභා ප්‍රතිපාදන යොදා ගනිමින් දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම, ප්‍රජා මණ්ඩල ශක්තිමත් කොට ඒ තුළින් යොවුන් ජනතාවගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කරමින් ශක්තිමත් පාලනයක් ගෙන යෑම මාගේ බලාපොරොත්තුවයි. මේ මැතිවරණයේදී ඔබ තෝරා ගත යුත්තේ ප්‍රදේශය පිළිබඳව හොඳ අවබෝධයක් හා අත්දැකීමක් ඇති දක්ෂ කණ්ඩායමකුයි. අතීතයේ හා වර්තමානයේ පවතින අත්දැකීම් හා අඩුපාඩු සැලකිල්ලට ගෙන අනාගතය වෙනුවෙන් සම්ප්‍රදායෙන් බැහැරව නව ආකල්ප හා නව දැක්මක් ඇතිව නිර්මාණශීලීත්වයෙන් යුතු සංවර්ධන මාවතකට යොමු වීම සඳහා දැන් කාලය පැමිණ තිබෙනවා. මෙම නව සංවර්ධන සැලැස්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ගමේ උරුමක්කාරයන් වන ඔබ මෙවර පළාත් පාලන මැතිවරණයේදී තෝරා පත් කරගත යුත්තේ කවුරුන්ද යන්න ඔබ ඔබේ හදවතින් විමසා බැලිය යුතුයි. පක්ෂ පාට අමතක කර කටයුතු කරන, දූෂණ වංචා ආදියෙන් කිලිටි නොවූ සුපිරිසුදු අවංක දේශපාලන චරිතයක් තෝරා පත් කර ගැනීමේ වගකීම බුද්ධිමත් ඔබ සතුයි."